# UNIVERSITY GRANTS COMMISSION

**ESTABLISHMENTS CIRCULAR LETTER NO:** 13/2013

No. 20, Ward Place
Colombo 07
13th September 2013

Vice Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

**COMPENSATION FOR UNIVERSITY EMPLOYEES WHO SUFFER INJURY WHILST ON DUTY**

Your kind attention is invited to Commission Circular No 748 dated 30.07.1999 and 757 dated 16.12.1999 on the above subject.

2. The Commission decided to adopt the following Public Administration Circulars for implementation in the University System.

- Public Administration Circular No. 22/93 of 21.09.1993
- Public Administration Circular No. 22/93(I) of 11.02.1994
- Public Administration Circular No. 22/93(III) of 04.05.2005
- Public Administration Circular No. 22/93(IV) of 29.12.2008
- Public Administration Circular No. 22/93(V) of 29.07.2011

3. Copies of the above Circulars are enclosed herewith for your information and compliance.

4. The Provisions of the Commission Circulars No. 748 and 757 respectively will not be operative with effect of issuing this Circular without prejudice to any action taken so far under such Circulars.

5. Please take action accordingly.

**Prof. Kshanika Hirimburegama**
Chairperson

Copies:
1. Secretary/ Ministry of Higher Education
2. Chairman's Office/UGC
3. Vice-Chairman/UGC
4. Members of the UGC
5. Secretary/UGC
6. Deans of Faculties
7. Registrars of Universities
8. Accountant/UGC
9. Bursars of Universities
10. Librarians/SAL/AL of the Higher Educational Institutions /Institutes
11. Deputy Registrars/ Snr. Asst. Registrars/Asst. Registrars of Campuses/Institutes
12. Deputy Bursars/Snr. Asst. Bursars/ Asst. Bursars of Campuses/Institutes
13. Chief Internal Auditor/UGC
14. Govt. Audit Superintendents of Universities
15. Snr. Asst. Int. Auditors of HEIs
16. Secretaries of trade Unions
17. Auditor –General

File No: UGC/HR/6/4/4

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 22/93.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993.09. 21 දින.

04-10-1993

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන රාජ්‍ය නිලධාරීන්ට වන්දි ගෙවීම.

ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන හෝ නොදරන හෝ ( හමුදා නිලධරයකු නොවන ) රජයේ නිලධාරියෙකුට හෝ අධිකරණ නිලධාරියෙකුට පහත සඳහන් අවස්ථාවකදී සිදුවන තුවාල නිසා, අදාළ නිලධාරියාගේ රැකියාව අනුව ඉපැයීමේ හැකියාව හීනවීම, නැතිවීම ශරීරයේ ස්ථිර විකෘතිවීම් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි වන්දි ගෙවිය යුතුය.

(අ) ඔහුගේ රාජකාරි ඉටු කිරීමේදී,

හෝ (ආ) ඔහු රාජකාරි ඉටු නොකරන අවස්ථාවකදී වුවද, ඔහුගේ සාමාන්‍ය රාජකාරිවල විෂය සීමාව ඇතුළත වූ යම් ක්‍රියාවක් කිරීමේදී,

හෝ (ඇ) ඔහුගේ රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්,

හෝ (ඈ) ඔහුගේ වාසස්ථානයේ සිට රාජකාරි සඳහා වාර්තා කිරීම පිණිස සේවා ස්ථානය දක්වා හෝ
රාජකාරියෙන් පසු ඔහුගේ සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා හෝ යන ගමනකදී,

හෝ (ඉ) සේවා ස්ථානයේ සිට රාජකාරි කටයුතු වල නිරතවීම සඳහා යන ගමනකදී හෝ සේවා ස්ථානයට ආපසු එන ගමනකදී, හෝ තුවාල සිදුවුවහොත්

මෙම චක්‍රලේඛයේ මතු සඳහන් වන අයුරින් වන්දි ගෙවිය යුතුය.

එසේ වුවත් එම නිලධාරියාට තුවාල සිදුවීම,

(I) යම් නීතියක් හෝ දෙපාර්තමේන්තු නියමයක් හෝ රෙගුලාසියක් හෝ උල්ලංඝනය වන අයුරින් ක්‍රියා කිරීම නිසා නම්,

හෝ/හා (II) නිලධරයාගේ සහායක නොසැලකිලිමත් භාවය නිසා නම්,
ඔහුට ලැබිය හැකි වන්දි මුදලෙහි යම් අඩු කිරීමක් කළ යුතුය.

(III) නිලධරයා බීමත්ව සිටියේ නම්, ඔහුට වන්දි ගෙවීමක් නොකළ යුතුය.

02. ගෙවන වන්දි ප්‍රමාණය ගණනය කිරීමේදී පදනම වන්නේ, එසේ තුවාලවීමෙන් ( නිලධාරියාගේ රැකියාව අනුව ) ඔහුගේ උපයීමේ ශක්තිය හීනවීම හෝ සදා සිරුරේ විරූපවීම ආදියෙහි ප්‍රමාණයයි.

03. (අ) <u>මූලපමය වන්දිය</u> –

(I) තුවාලයෙන් මරණය සිදුවුනි නම් – මෙම චක්‍රලේඛයේ 5 වන වගන්තියේ සඳහන් වන්දි ගෙවීම් පිළිබඳව ක්‍රියාකරන කමිටුවේ නිර්දේශ මත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයා විසින් නිලධාරියාගේ යැපෙන්නන්ට මාස 60 ක වැටුප් ගෙවීම.

(II) එම තුවාලයෙන් සදා සම්පූර්ණ ආබාධිත තත්වයට පත්වුයේ නම් – මෙම චක්‍රලේඛයේ 5 වන වගන්තියේ සඳහන් වන්දි ගෙවීමේ කමිටුව විසින් සේවයට නුසුදුසු බැව් තීරණය කිරීමෙන් පසුව මාස 60 ක වැටුප වන්දි වශයෙන් ගෙවනු ලබන අතර, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ නිර්දේශයද වෛද්‍ය මණ්ඩල වාර්තාවද පදනම් කරගෙන තීරණ ගනු ලබනු ඇත. "සදා සම්පූර්ණ ආබාධිතතාවය" යටතේ රෝගියකු වර්ගීකරණය කෙරෙන විට උපයීමේ ශක්තිය හීනවීමේ/ආබාධිතභාවයේ ප්‍රතිශතයක් වෛද්‍ය මණ්ඩලය සඳහන් නොකරනු ඇත. රෝගියා ඔහුගේ වර්තමාන රැකියාව කිරීම සඳහා සුදුසු නොවන බවත් ඔහු "සදා සම්පූර්ණ ආබාධිත තත්වයට පත්ව ඇති බවත්" ඒ වෙනුවට වාර්තා කරනු ඇත.

(III) එම තුවාලයෙන් සදා අර්ධ ආබාධිත තත්වයට පත්විනි නම් – මෙම චක්‍රලේඛයේ ඇමුණුම I හි දක්වා ඇති, උපලේඛනය ප්‍රකාරව වෛද්‍ය මණ්ඩලය විසින් නිගමනය කරනු ලැබූ උපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය පදනම් කරගෙන මාස 45 ක වැටුපේ ප්‍රතිශත ප්‍රමාණයක් ලෙස මෙම චක්‍රලේඛයේ 5 වන උප වගන්තියේ සඳහන් වන්දි ගෙවීම පිළිබඳ කමිටුව විසින් ගෙවිය යුතු වන්දිය තීරණය කර ලබනු ඇත. රෝගියා ඔහුගේ වර්තමාන රැකියාව සඳහා නුසුදුසු වනවිට එවැනි

(IV) එම තුවාලයෙන් තාවකාලික අර්ධ ආබාධිත තත්ත්වයට පත්වීමක්

සෞඛ්‍ය විෂය පිළිබඳ වන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස් පරිදි වෛද්‍ය මණ්ඩලය නිගමනය කරනු ලැබ ඇති (තාවකාලික) ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය මත පදනම් කරගෙන මාස 10 ක වැටුපේ ප්‍රතිශත ප්‍රමාණයක් ලෙස මෙම චක්‍රලේඛයේ 5 වන වගන්තියේ සඳහන් වන්දි ගෙවීම පිළිබඳ කමිටුව විසින් ගෙවිය යුතු වන්දිය තීරණය කරනු ලබනු ඇත. වෛද්‍ය මණ්ඩලයේ පරීක්ෂාවට භාජනය කරනු ලබන අවස්ථාවේදී ලබාගත හැකි වාර්තා පදනම් කරගෙන, රෝගියා තුවාලය ලැබූ අවස්ථාවේදී පත්ව සිටි තාවකාලික ආබාධිත තත්ත්වය වෛද්‍ය මණ්ඩලය සැළකිල්ලට ගනු ලබනු ඇත.

රෝගියාගේ ඉපයීමේ ශක්තිය හීනවීම සහ/හෝ සදා විරූපවීම පිළිබඳව නිගමනය කිරීම සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෛද්‍ය මණ්ඩලයක් පත් කරනු ඇත.

(ආ) <u>වන්දි විශ්‍රාම වැටුප්</u>

(I) ලත් තුවාල නිසා මිය යන හෝ සදා සම්පූර්ණ බෙලහීනතාවයට පත්වන නිලධාරියෙකු අවුරුදු 55 ට අඩු නම්, ඔහු කල්පිතව අවුරුදු 55 න් විශ්‍රාම ගියාසේ සලකා විශ්‍රාම වැටුප ගණනය කරනු ලැබේ.

(II) එසේ මිය යන හෝ සදා සම්පූර්ණ දුබලතාවයට පත්වන නිලධාරියකු, අවුරුදු 55 ට වැඩි නම්, ඔහු කල්පිතව වයස අවුරුදු 60 දී විශ්‍රාම ගියා සේ සලකා විශ්‍රාම වැටුප ගණනය කරනු ලැබේ. මේ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කරනු ලැබේ.

(ඇ) <u>නිවාඩු</u>

තුවාලයේ ස්වභාවය අනුව හා වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශ අනුව, පහත සඳහන් අයුරින් නිවාඩු අනුමත කළ යුතුයි.

(I) වර්ෂයක් දක්වා වැටුප් සහිත නිවාඩු හා ඉන්පසු මාස හයක් දක්වා අඩ වැටුප් නිවාඩු.

(II) ඉහත (I) සඳහන් කර ඇති එක් අවුරුදු නිවාඩුවට අමතරව, තමාට හිමි ඉතුරු නිවාඩු ලබාගැනීමට නිලධාරියාට අවසර ඇත.

( ඉහත විධිවිධාන අඩංගු වන සේ ආයතන සංග්‍රහය සංශෝධනය කරනු ලැබේ. )

04. වන්දි ගෙවීම සඳහා සාධක වන සාක්ෂි:

(අ) (I) දෙපාර්තමේන්තු ප්‍රධානියා තුවාල ලත් නිලධාරියා වහාම වෛද්‍ය ප්‍රතිකාර සඳහා යැවිය යුතුය.

හමුවට

(II) ඔහු වෛද්‍ය මණ්ඩලයක්/පත්කරන ලෙස ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් වහාම ඉල්ලීමක් කළ යුතුය.

(III) වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලය,

මෙම චක්‍රලේඛයේ 2 වැනි වගන්තියේ කුමන වර්ගයට රෝගියා අයත් වන්නේද යන්න සහ/හෝ ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය සහ/හෝ ශරීරයේ සදා විරූපවීමක් ඇත්නම් එය, රෝගියාගේ සාමාන්‍ය රාජකාරි ඉටු කිරීමට ඇති හැකියාව, නිලධාරියාට ඇයුතු තුවාල, දැක්වෙන සිය වාර්තාව දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යැවිය යුතුය.

(ආ) සෞඛ්‍ය විෂය පිළිබඳ වන අමාත්‍යාංශයේ ලේකම් මෙම විධිවිධාන පිළිපැදීම සඳහා අවශ්‍ය උපදෙස් සියළුම අදාල නිලධාරීන්ට දැන්විය යුතුය. තවද, රෝගීන්ගේ ( මෙම ක්‍රමය යටතේ වන්දි ලැබීමට හිමිකම් ඇති ඔහු රාජ්‍ය නිලධාරියකු හෝ අධිකරණ නිලධාරියකු නම් ) අඳද ඉහපත ඇතුළු සියළුම වාර්තා වෙනම ලේඛනාගාරයක හෝ කැබිනට්ටුවක වෛද්‍ය මණ්ඩල වල ප්‍රයෝජනය සඳහා පහසුවෙන් සොයා ගැනීම පිණිස ගබඩා කර තබන මෙන් සියළුම වෛද්‍ය බලධාරීන්ගෙන් ඔහු විසින් ඉල්ලා සිටිනු ඇත.

05. තීරණ බලධාරියා.

දෙපාර්තමේන්තු ප්‍රධානියා වෛද්‍ය මණ්ඩලයේ වාර්තාවද, පොලිස් වාර්තාවද, දෙපාර්තමේන්තු පරීක්ෂණ වාර්තාවද, අනතුර පිළිබඳව ඇති තවු පිළිබඳව ඇති ඕනෑම තොරතුරක්ද, ඔහුගේ නිර්දේශයන්ද සහ නීති කඩකිරීම්, දෙපාර්තමේන්තු රෙගුලාසි කඩකිරීම් සහ නිලධාරියාගේ නොසැලකිලිමත්කම් පිළිබඳව ඔහුගේ නිරීක්ෂණ ද සමඟ ආයතන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළයුතුය. වන්දි ගෙවීම තීරණය කරනුයේ ආයතන අධ්‍යක්ෂ, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ හා භාණ්ඩාගාරයේ මුදල් අධ්‍යක්ෂ යන අයගෙන් සමන්විත මණ්ඩලයක් විසිනි.

06. මෙම ක්‍රමය 1993.10.01 දින සිට ක්‍රියාත්මක වේ. 1986.10.03 දිනැති අංක 346 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 1993.10.01 දින සිට අවලංගු කරනු ලැබේ.

07. මේ සමඟ ඇති ඇමුණුම් (1) 1988.07.13 දිනැති අංක 21/88 සහ 1989.11.30 දිනැති අංක 59/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්ට ද අදාළ විය යුතුය.

( එම්.ඩී.ඩී. පීරිස් )

22/93

ඇමුණුම I

## I වන උපලේඛනය

( 2 (1) වන වගන්තිය)

### ස්ථිර අසම්පූර්ණ අබලතාවක් සිදුකෙරේ යයි සලකනු ලබන තුවාල ලැයිස්තුව.

| තුවාල | ඉපැයීමේ ශක්තිය හානිවීමේ ශක්තිය |
|---|---|
| ස්ථිර වශයෙන්ම ඔත්පලවීමක් සිදු කෙරෙන ස්ථිර පුද අසාධ්‍ය පුද අවයව පක්ෂඝාතය හෝ තුවාල | 100 |
| වැඩ කිරීමේ පූර්ණ අශක්තතාව සිදු කෙරෙන, ස්ථිර වශයෙන්ම අසාධ්‍ය මානසික ශක්තිය නැතිවීමේ හෝ ස්ථිර වශයෙන්ම වැඩ කිරීමේ පූර්ණ අශක්තතාවය සිදු කෙරෙන වෙනත් යම් තුවාලයක් | 100 |
| **ඇසේ තුවාල.** | |
| (I) ඇස් දෙකේ පෙනීම මුළුමනින්ම නැතිවීම | 100 |
| (II) එක ඇසක පෙනීම මුළුමනින්ම නැතිවීම | 50 |
| (III) එක් ඇසක පෙනීම යම් ප්‍රමාණයකින් නැතිවීම | 25 |
| **ශ්‍රවණ ආබාධ.** | |
| (I) ශ්‍රවණය මුළුමනින්ම නැතිවීම | 60 |
| (II) එක් කනක ශ්‍රවණය මුළුමනින්ම නැතිවීම | 30 |
| (III) එක් කනක ශ්‍රවණය යම් ප්‍රමාණයකින් නැතිවීම | 15. |
| **කථනය නැතිවීම.** | |
| (I) කථනය මුළුමනින්ම නැතිවීම | 75 |
| (II) කථනය යම් ප්‍රමාණයකින් නැතිවීම | 35 |
| **ඉන්ද්‍රියයන් නැතිවීම.** | |
| (I) ගන්ධ සහ රස දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින්ම නැතිවීම | 50. |
| (II) ගන්ධය දැනෙන ඉන්ද්‍රිය මුළුමනින්ම නැතිවීම | 25 |
| (III) රසය දැනෙන ඉන්ද්‍රිය මුළුමනින්ම නැතිවීම | 25 |

පා අ

බාහුවේ තුවාල.

| | | |
|---|---|---|
| (I) | වැලමිටෙන් හෝ ඊට ඉහළින් බාහුව නැතිවීම | 75 |
| (II) | වැලමිටෙන් හෝ ඊට පහළින් බාහුව නැතිවීම | 65 |

විවිධ

අත්වල තුවාල.

| | | |
|---|---|---|
| (I) | අත් දෙකම නැතිවීම | 100 |
| (II) | අතක් හෝ මාපට ඇඟිල්ලක් සහ ඇඟිලි හතරක් නැතිවීම | 65 |
| (III) | මාපට ඇඟිල්ලක් (ඇඟිලි පුරුක් දෙකම) නැතිවීම | 35 |
| (IV) | මාපට ඇඟිල්ලක් (එක් ඇඟිලි පුරුකක්) නැතිවීම | 20 |
| (V) | ඇඟිලි හතරක් නැතිවීම | 60 |

දබරැඟිල්ල නැතිවීම.

| | | |
|---|---|---|
| (I) | පුරුක් තුනක් | 30 |
| (II) | පුරුක් දෙකක් | 20 |
| (III) | පුරුක් එකක් | 10 |

සට

මැද, වෙද සහ සුළැඟිලි නැතිවීම

| | | |
|---|---|---|
| (I) | ඇඟිලි පුරුක් තුනක් | 20 |
| (II) | ඇඟිලි පුරුක් දෙකක් | 10 |
| (III) | ඇඟිලි පුරුක් එකක් | 05 |

කකුල නැතිවීම.

| | | |
|---|---|---|
| (I) | දණහිසින් හෝ ඉන් ඉහළට | 75 |
| (II) | දණහිසින් හෝ ඉන් පහළට | 65 |

පාදවල තුවාල.

| | | |
|---|---|---|
| (I) | දෙපා නැතිවීම | 100 |
| (II) | එක් පාදයක් නැතිවීම | 75 |

පා ඇඟිලි නැතිවීම.

| | | |
|---|---|---|
| (I) | පා මාපට ඇඟිල්ල - ඇඟිලි පුරුක් දෙකම | 20 |
| (II) | පා මාපට ඇඟිල්ල - එක් ඇඟිලි පුරුකක් | 10 |
| (III) | පා මාපට ඇඟිල්ල හැරුණු විට එකකට වැඩි ඇඟිලි ගණනක් නැති වුවහොත් එක් එක් ඇඟිල්ලට | 10 |

විවිධ.

| | | |
|---|---|---|
| (I) | ජනනේන්ද්‍රියන් මුළුමනින්ම නැතිවීම | 75 |
| (II) | ජනනේන්ද්‍රියන් අසම්පූර්ණ වශයෙන් නැතිවීම | 40 |
| (III) | මුහුණේ බරපතල කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපවීම | 75 |
| (IV) | මුහුණේ කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපවීම හැරුණු විට ශරීරය බරපතල ලෙස විරූපවීම - උපරිමය | 50 |
| (V) | එක් දතක් නැතිවීම | 05 |
| (VI) | වෛද්‍ය නිලධරයකු විසින් තක්සේරු කරනු ලැබිය යුතු ඉහත සඳහන් නොකරන ලද යම් අවයවයක් හෝ ඉන් යම් කොටසක් (උදා: නාසය, ලපැත්ත, කණ ආදිය) නැතිවීම උපරිමය | 50 |

සටහන:- ලබාගත හැකි වාර්තා පදනම් කරගෙන තුවාලය සෑබූ අවස්ථාවේදී රෝගියා පත්ව තිබූ තාවකාලික ආබාධිත භාවය සඳහා 10% ක උපරිම ප්‍රමාණයක් නිර්දේශ කළ හැකිය.

යම් එක් අනතුරකදී මුළු තක්සේරුව 100% නොඉක්ම විය යුතුය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/93(1)

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1994.02.11වැනි දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

රාජකාරියේ යෙදී සිටියදී තුවාල සිදුවන
රාජ්‍ය නිලධාරීන්ට වන්දි ගෙවීම.

1993.09.21 දිනෙන් යුතු වූ මගේ අංක. 22/93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඉංග්‍රීසි පිටපතේ 1 වැනි උප ලේ'ණයේ 'විවිධ' යටතේ අංක. (V) හි "එක් දතක් නැතිවීම" සඳහා ශක්තිය හීනවීම 50% ක් වශයෙන් දක්වා ඇත. එය 05% ක් වශයෙන් සංශෝධනය විය යුතු බැව් සටහන් කරගතු මැනවි.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :22/93 (III)

මගේ අංකය: ආ/8/2/576/26
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2005 මැයි මස 04 දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජකාරියෙහි යෙදී සිටියදී තුවාල ලබන**
**<u>රාජ්‍ය නිලධාරීන්ට වන්දි ගෙවීම</u>**

1993.09.21 දිනැති අංක 22/93 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් දනට ගෙවනු ලබන මූල්‍යමය වන්දි ප්‍රමාණය එහි 1 ඡේදයේ පහත සඳහන් අවස්ථාවලදී සිදුවන අනතුරු වෙනුවෙන් සියයට සියයකින් (100%) වැඩිකර ගෙවීමට රජය තීරණය කර ඇත.

I. ස්වකීය රාජකාරි ඉටු කිරීමේදී
II. රාජකාරි ඉටු නොකරන අවස්ථාවකදී වුවද ස්වකීය සාමාන්‍ය රාජකාරිවල විෂය සීමාව ඇතුළත වූ යම් ක්‍රියාවක් කිරීමේදී
III. ස්වකීය රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්
IV. සේවා ස්ථානයේ සිට රාජකාරි කටයුතුවල නිරතවීම සඳහා යන ගමනකදී හෝ සේවා ස්ථානයට ආපසු එන ගමනකදී

03. 2005.01.01 දින හෝ එදිනට පසුව සිදුවූ හදිසි අනතුරු වෙනුවෙන් පමණක් ඉහත සඳහන් සංශෝධිත මූල්‍යමය වන්දි ගෙවීම් ක්‍රියාත්මක කරනු ලැබේ.

04. තවද 2005.01.01 දිනට පෙර සිදුවූ හදිසි අනතුරු වෙනුවෙන් සහ වාසස්ථානයේ සිට රාජකාරි සඳහා වාර්තා කිරීම පිණිස සේවා ස්ථානය දක්වා හෝ රාජකාරියෙන් පසු ස්වකීය සේවා ස්ථානයේ සිට වාසස්ථානය දක්වා හෝ යන ගමනකදී සිදුවන අනතුරක් වෙනුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 හි 3 වන ඡේදයේ සඳහන් මූල්‍යමය වන්දි ප්‍රමාණය ඒ අයුරින්ම ගෙවනු ලැබේ.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:22/93 (iv)

මගේ අංකය:-ආ/8/2/576/33
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07
2008 දෙසැම්බර් මස 29

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරුවලට ලක්වීමෙන්
**පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වන රාජ්‍ය නිලධාරීන්ට සහන සැලසීම.**

1986.10.08 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 346 සහ 1993.10.01 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 අනුව වන්දි ලබා ගත් නිලධාරීන්ටද අදාලවන පරිදි රාජකාරියේ යෙදී සිටියදී හදිසි අනතුරුවලට ලක්වීමෙන් පූර්ණ අබාධිත තත්වයට පත්වන රාජ්‍ය නිලධාරීන්ට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අනතුරට පත්වූ දින සිට වයස අවුරුදු 55 සම්පූර්ණවන තෙක් ඔහුට හිමි වැටුප ගෙවීමට රජය තිරණය කර ඇත.

I. එම වැටුපෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීම

II. වයස අවුරුදු 55 දී නිලධාරියා ලබන වැටුප අනුව ගණනය කර විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම.

02 2005.05.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (III) හි සඳහන් රාජකාරි අවස්ථාවන්හි සිදුවන හදිසි අනතුරු සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල කර ගත යුතුය. එනම්,

* ස්වකීය රාජකාරි ඉටු කිරීමේදී,
* රාජකාරි ඉටු නොකරන අවස්ථාවකදී වුවද ස්වකීය සාමාන්‍ය රාජකාරිවල විෂය සීමාව ඇතුලතවූ යම් ක්‍රියාවක් කිරීමේදී,
* ස්වකීය රාජකාරි කටයුතු ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්,
* සේවා ස්ථානයේ සිට රාජකාරි කටයුතු වල නිරතවීම සඳහා යන ගමනකදී හෝ සේවා ස්ථානයට ආපසු එන ගමනකදී.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ප්‍රතිලාභ ලබා ගැනීමට නිලධාරියා කැමත්ත ප්‍රකාශ කරන්නේ නම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 346 සහ 22/93 හි විධිවිධාන අනුව මෙතෙක් ලබාගත් ප්‍රතිලාභ එනම් වන්දි මුදල විශ්‍රාම වැටුප සහ වන්දි විශ්‍රාම වැටුප ආපසු අයකර ගතයුතුය.

04. මෙම විධිවිධාන අනුව ප්‍රතිලාභ ලබා ගන්නා නිලධාරීන්ට 1988.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/88 හි විධිවිධාන අනුව වන්දි ලබා නොදිය යුතුය.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 (V)

මගේ අංකය : EST/8/COMPT/02/3000/7
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2011 ජූලි මස 29 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන රාජ්‍ය නිලධාරීන්ට වන්දි ගෙවීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන 1993.09.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/93 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ 05 ඡේදයේ සඳහන් රාජ්‍ය නිලධාරීන්ට හදිසි අනතුරු වන්දි ගෙවීම තීරණය කිරීම සඳහා පත් කර ඇති වන්දි මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ඉල්ලීම්වලට අදාලව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත අභියාචනා මණ්ඩලයක් පත්කිරීමට තීරණය කර ඇත.

I. රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් ( සභාපති )

II. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ( සාමාජික )

III. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් ( සාමාජික )

03. ඉහත 01 ඡේදයේ සඳහන් චක්‍රලේඛයේ 05 ඡේදයේ විධිවිධාන අනුව ඉදිරිපත් කළ යුතු දෙපාර්තමේන්තු පරීක්ෂණ වාර්තාව මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් යුතු සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් සකස් කළ යුතුය.

04. නිලධාරියා රාජකාරියට පැමිණෙමින් සිටියදී හෝ සේවය නිමකර ආපසු යාමේදී සිදුවූ අනතුරක් නම් එම වාර්තාවට පහත සඳහන් කරුණු ඇතුලත් විය යුතුය.

(අ). නිලධාරියා සේවා ස්ථානයට සාමාන්‍යයෙන් පැමිණිය යුතු වේලාව / පිටවිය යුතු වේලාව සහ පැමිණි / පිටවූ වේලාව.

(ආ). නිලධාරියා සාමාන්‍යයෙන් සේවා ස්ථානයට පැමිණෙන ලිපිනය, අනතුර සිදුවී ඇති ස්ථානයට ඇති දුර, පැමිණි ආකාරය, ගමන් කල දුර හා ගතවී ඇති වේලාව. ( සාමාන්‍ය ගමන් මාර්ගයෙන් බැහැර තැනකදී අනතුර සිදුවී ඇත්නම් ඒ පිලිබඳ වැඩිදුර පැහැදිලිකිරීම් අවශ්‍යය.)

(ඇ). හැකි අවස්ථාවලදී නිලධාරියාගේ ප්‍රකාශයේ සහ අනතුර දුටු අයගේ ප්‍රකාශයන්හි අන්තර්ගත කරුණු පිලිබඳ නිරීක්ෂණ.

(ඈ). සතිඅන්ත හෝ රජයේ නිවාඩු දිනයකදී අනතුර සිදුවී ඇත්නම් සේවය කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන ඇත්ද යනවග.

(ඉ). මෝටර් රථයක් / යතුරුපැදියක් / වෙනත් වාහනයක් ධාවනය කරමින් සිටියදී අනතුර සිදුවී ඇත්නම් රියදුරු බලපත්‍රය, ආදායම් බලපත්‍රය සහ රක්ෂණාවරණය තිබේද යනවග.

05. නිලධාරියා රාජකාරියේ නිරතව සිටියදී සිදුවූ අනතුරක් නම් එම වාර්තාවට පහත සඳහන් කරුණු ඇතුලත්විය යුතුය.

(අ). නිලධාරියාගේ සාමාන්‍ය රාජකාරි වේලාව සහ පැමිණි වේලාව.

(ආ). අනතුර සිදුවී ඇත්තේ නිලධාරියාගේ සාමාන්‍ය රාජකාරියක් ඉටුකිරීමේදීද නැතහොත් පවරන ලද විශේෂ රාජකාරියක් ඉටුකිරීමේදීද යනවග.

(ඇ). හැකි අවස්ථාවලදී නිලධාරියාගේ ප්‍රකාශයේ සහ අනතුර දුටු අයගේ ප්‍රකාශයන්හි අන්තර්ගත කරුණු පිලිබඳ නිරීක්ෂණ.

(ඈ). සතිඅන්ත හෝ රජයේ නිවාඩු දිනයකදී අනතුර සිදුවී ඇත්නම් සේවය කිරීම සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන ඇත්ද යනවග.

(ඉ). මෝටර් රථයක් / යතුරුපැදියක් / වෙනත් වාහනයක් ධාවනය කරමින් සිටියදී අනතුර සිදුවී ඇත්නම් රියදුරු බලපත්‍රය, ආදායම් බලපත්‍රය සහ රක්ෂණාවරණය තිබේද යනවග.

<u>සටහන :</u> අදාල අවස්ථාවන්හිදී පැමිණීමේ ලේඛනයේ, රියදුරු / ආදායම් බලපත්‍ර හා රක්ෂණාවරණයේ පිටපත් අමුණා එවිය යුතුය.

06. හදිසි අනතුරු සඳහා ඉදිරිපත් කරනු ලබන වන්දි අයදුම්පතේ අංක 01 හි සඳහන් අනතුරට පත් නිලධාරියාගේ නමට අනතුරුව අංක 01:01 ලෙස නැවත අංකනය කරමින් ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කළ යුතුය.

07. හදිසි අනතුර සිදුවී වසරක් ඇතුලත අදාල වන්දි අයදුම්පත ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. එම කාලසීමාවට වඩා ප්‍රමාදවී වන්දි අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් එම ප්‍රමාදයට හේතුවූ කරුණු හා එය සාධාරණීකරණය කළ හැකි බවට පෞද්ගලිකවම සෑහීමකට පත්වන්නේ නම් පමණක් ඒ බැව් සනාථ කරමින් අදාල අමාත්‍යාංශ ලේකම්ගේ වාර්තාවක්ද සමඟ වන්දි අයදුම්පත ඉදිරිපත් කළයුතුය.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය